Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2018/06/19

පැමිණිලිකරු : එස්.ජී නුවන් කුමාර මයා.
නො : 56/33. බාන්ස් පෙදෙස.
කොළඹ 07.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති.
රාජකීය විද්‍යාලය.
කොළඹ.

02 ජාතික පාසැල් අධ්‍යක්ෂ.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

පැමිණිලි අංකය : **HRC/1682/17**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තම දරුවා වන නෙතුක මිහින් සුභසිංහ දරුවා 2017 වර්ෂයේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට ආසන්නතා පදනම යටතේ අයදුම්පතක් යොමුකළ බවත්. එසේ අයදුම්පත් යොමුකළ පසු සම්මුඛ පරීක්ෂණයට භාජණය කළ බවත් එහිදී තමාගේ ඔප්පුව තෑගි ඔප්පුවක් බැවින් හා එම තෑගි ඔප්පුව ප්‍රකාශන ඔප්පුවක් මත පදනම්ව ලබා දී ඇති බැවින් එහි ගැටළුවක් ඇති බව පවසා තමා වෙත ලබා දෙන ලද සියළු ලකුණු අහෝසි කළ බවත්ය. ඉන් අනතුරුව මේ සම්බනධයෙන් පැමිණිලිකරු අධ්‍යාපන අමාත්‍යංශය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ පසු අධ්‍යාපන අමාත්‍යංශය මඟින් 2017.02.21 වන දින ළමුන් 5 දෙනකුගේ නම් සහිතව තමාගේ දරුවා ද කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බවත්. අමාත්‍යංශය විසින් දන්වන ලද අනෙකුත් දරුවන් විද්‍යාලයට ඇතුළත් කොටගෙන ඇතත්. තමාගේ දරුවා ඇතුළත් කර නොමැති බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. මෙම පැමිණිලිකරුගේ දරුවා රාජකීය විද්‍යාලයට ඇතුළත් කරගැනීම සඳහා RC/S/17/6156 යටතේ සම්මුඛ

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂනික / துரித அழைப்பு / Hotline: 011-2505575 / 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පරීක්ෂණයට භාජනය කර ඇති බවත්. ඔවුන් ඉදිරිපත් කර ඇති තෑගි ඔප්පුවට පූර්ව ඔප්පුව ප්‍රකාශන ඔප්පුවක් වන බැවින් එහි වසර 10ක ලියාපදිංචියක් පත්ඉරු මඟින් සනාථ කිරීමේ අවශ්‍යතාවයක් ඉටු වී නොමැති බවත්. ඒ මත නීත්‍යානුකූල හිමිකමක් සහිත පදිංචිය සනාථ නොවන බැවින් අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් ලකුණු ලබා දී නොමැති බවත් දක්වා ඇත. පසුව අයදුම්කරු අමාත්‍යංශය වෙත කරන ලද අභියාචනයක් විමර්ශනය කිරීමෙන් පසුව මෙම දරුවා ඇතුළු තවත් දරුවන් කිහිපදෙනකු ඇතුළත් කරගන්නා ලෙස දන්වා ඇතත්. පාසල වෙතින් මේ සම්බන්ධ තොරතුරු විමර්ශනය කළ අතර ලිපිගොනුව පරීක්ෂා කිරීමේදී අදාළ ලිපිගොනුවට ලකුණු ලබා දී නොමැති තත්වයක් මත මෙම ඇතුළත් කිරීම ගැටළු සහගත බැවින් ඒ පිළිබඳව අමාත්‍යංශයෙන් වැඩිදුරටත් උපදෙස් ඉල්ලා ඇති බවද දක්වා ඇත. ඒ අනුව උපදෙස් ලැබෙන තෙක් මෙම ඇතුළත් කිරීම නතර කර ඇති බවද සඳහන් කර ඇත.

නිරීක්ෂණ :-

මෙම පැමිණිල්ලට අදාළ ප්‍රශ්නගත කාරණය වන හිමිකම් ඔප්පුව ත්‍යාග ඔප්පුවක් බව හා එයට පූර්ව ඔප්පුව ප්‍රකාශන ඔප්පුවක් වන බව හා එම ප්‍රකාශන ඔප්පුවට වසර 10 ක කාලය සම්පූර්ණ නොවීම මත ඊට ලබාදෙන ලද ලකුණු ලබා නොදීමට වගඋත්තරකරුවන්ට අදාළ චක්‍රලේඛනය ප්‍රකාරව ප්‍රතිපාදන ඇති බව නිරීක්ෂණය වේ.

නමුත් එම හිමිකම් ඔප්පුවට ලකුණු ලබා දිය නොහැක යන කාරණය පදනම් කරගෙන අනෙකුත් පැමිණිලිකරු හිමිකම් කියන ලකුණු ඔහුට ලබා නොදී සිටීමට වගඋත්තරකරුවන්ට චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රතිපාදන සැලසී නොමැති බව නිරීක්ෂණය වේ.

නමුත්. වගඋත්තරකරුවන් පැමිණිලිකරුට ඡන්දය සඳහා හිමිවන ලකුණු. ආසන්නතාවයට හිමිවන ලකුණු සහ වෙනත් ලේඛන සඳහා හිමිවන ලකුණු යන කිසිදු ලකුණක් ලබා දී නොමැති අතර එම තත්වය මත පැමිණිලිකරුගේ නීතියේ රැකවරණය අහිමි වී ඇති බව කොමිෂන් සභාවේ නිරීක්ෂණය වේ.

පාසැලට ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණු සීමාව ලකුණු 58 ක් වන අතර. පැමිණිලිකරුට හිමිකම් ඔප්පුවට හිමිවන ලකුණු හැර අනෙකුත් ලකුණු ලබා දුන් විට කඩඉම් ලකුණු සීමාව ඉක්මවන්නේ නම් පැමිණිලිකරුගේ දරුවා විද්‍යාලයට ඇතුළත් කිරීමට හිමිකම් ලබන බව මේ අනුව නිරීක්ෂණය වේ. එසේම අවශ්‍ය වන්නේ නම් පැමිණිලිකරුගේ අදාළ ස්ථානයේ පදිංචිය ස්ථාන පරීක්ෂාවක් මඟින් තහවුරු කර ගැනීමේ හැකියාව වගඋත්තර පාර්ශවය වෙත තිබිණ.

වගඋත්තරකරුවන් විසින් පදිංචිය සනාථ කරන ලේඛන ලෙසට පැමිණිලිකරුගේ දරුවාගේ උප්පැන්න සහතිකය. පැමිණිලිකරුගේ ජාතික හැඳුනුම්පත. පාසැල් ශිෂ්‍ය කාර්ය දර්ශකය. විවාහ සහතිකය. විදුලි බිල්පත්. ජල බිල්පත්. ඡන්ද හිමි නාමලේඛනය. ජංගම දුරකථන බිල්පත්. රියදුරු බලපත්‍රය. බැංකු ගිණුම්. ග්‍රාම නිලධාරී සහතිකය සහ පත්වීම් ලිපි ආදී ලේඛන ඉදිරිපත් කර ඇති අතර එම ලේඛන අනුව පැමිණිලිකරු පදිංචි ලිපිනය තහවුරු වන බව නිරීක්ෂණය වේ. එමෙන්ම. මෙම ලේඛන පැමිණිලිකරු පාසැල වෙත ඉදිරිපත් කර ඇති බවද සඳහන් කර ඇත.

මීට අමතරව අධ්‍යාපන අමාත්‍යංශය මගින්ද විමර්ශනයක් සිදුකර පැමිණිලිකරුගේ දරුවා පාසැලට ඇතුළත් කර ගන්නා ලෙසට ලිඛිතව දැනුම්දී ඇති බව පැමිණිලි පාර්ශවය හා වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව පැහැදිලි වේ. නමුත් වගඋත්තරකාර පාසැල විසින් කිසිදු ලකුණක් පැමිණිලිකරු වෙත ලබා නොදීම තුළ ගැටළු සහගත තත්වයකට මුහුණ දී ඇති බව නිරීක්ෂණය වේ. ඒ තුළ වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙනස්කමකට භාජනය කර ඇති බවත් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවත් මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. පැමිණිලිකරුගේ දරුවා වන නෙතුක මිහින් සුභසිංහ යන අය පාසැලට ඇතුළත් කිරීමට අදාළව ඉදිරිපත් කර ඇති ලේඛන අතරින් හිමිකම් ඔප්පුව හැර අනෙකුත් ලේඛන දෙමව්පියන් ඉදිරියේ නැවත පරීක්ෂා කර චක්‍රලේඛනය ප්‍රකාරව ලකුණු ලබා දීමට කටයුතු කළ යුතුය.

02. ඒ අනුව පාසැලට ළමුන් ඇතුළත් කර ඇති කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 58 හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් පැමිණිලිකරුට හිමිවන්නේ නම් හෝ පොරොත්තු ලේඛනය අනුව පැමිණිලිකරු සුදුසුකම් සපුරන්නේ නම් පැමිණිලිකරුගේ දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

2018. 07 . 19 දිනට පෙර මෙම නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/